**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2013**

**------------------------------------------**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර)

----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 නොවැම්බර් 09 දිනැති අංක 1783/35 දරන ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් දී තිබූ නියෝගය ප්‍රකාරව, ආයෝජන මණ්ඩල පනතේ සඳහන් කාර්යයන් සඳහා යොදා ගැනීමට හම්බන්තොට පිහිටි හෙක්ටයාර 228. 8784 ක් වූ භූමි භාගයක අයිතිය ආයෝජන මණ්ඩලයට පවරා තිබුණි. කෙසේ වුවද ශ්‍රීලංගිප්‍ර 16 ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 වන විටත් මෙම ඉඩම අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර 18 අනුව, අඛණ්ඩව සේවා සැපයීම සඳහා ගාස්තු එම සේවා සැපයූ වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත යුතුය. කෙසේ වුවද අවලංගු කළ හා අත්හිටවූ ව්‍යාපෘතිවලට අදාළ රු.3,301,942 ක මුදලක් කිසිදු සේවාවක් සැපයීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් වාරික ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. තවද රු.179,547,196 ක් වූ එම ආදායම විලම්බිත බදු ශේෂය තුළද ඇතුළත් කර තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට විලම්බිත බදු ශේෂයද එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වටිනාකම රු.202,530,307 ක් වූ සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් අදාළ වත්කම් ගිණුමට මාරු කිරීම වෙනුවට කෙරී ගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි.

(ආ) 2013 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු (VAT) වාර්තාව අනුව, ඉඩදිය නොහැකි එකතු කළ අගය මත යෙදවුම් බදු අඩුවෙන් දැක්වීම මඟින් රු. 9,108,682 ක්වූ එකතු කළ අගය මත බදු ආයෝජන මණ්ඩලය විසින් පැහැර හැර තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හා සමාලෝචිත වර්ෂය සඳහා ලාභය පිළිවෙලින් එම මුදලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතන 10 ක් විසින් පදිංචිව සිටි අක්කර 1.62 ක ඉඩමකට අදාළව රු. 899,569 ක්වූ බිම් කුලී 2013 වර්ෂය තුළදී ඉන්වොයිස් කර හෝ ගිණුම් ගත කර නොතිබුණි. එබැවින් ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කටුනායක අපනයන සැකසුම් කලාපයේ බෝර්හෝල් පොම්ප (Borehole Pumps) සැපයීම හා සවිකිරීම සඳහා ලබා දෙන ලද රු. 1,363,239 ක වැඩ පූර්ව අත්තිකාරමක් 2008

පෙබරවාරි මාසයේ ව්‍යාපෘතිය නිම කිරීමේදී නිරවුල් කර තිබුණි. එසේ වුවද, එය සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ වැඩපූර්ව අත්තිකාරමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) අරමුදල් 3 කින් ලැබුණු රු. 10,118,713 ක් 2013 දෙසැම්බර් 31 දිනට සාවද්‍ය ලෙස විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඊ) ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු කුලී ආදායමට අදාළව රු. 4,796,760 ක්වූ එකතු කළ අගය මත බදු ඇතුළත් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා එකතු කළඅගය මත බදු (Vat returns) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය එකතු කළ අගය මත බදු වාර්තා ශේෂය සමග එකඟ නොවුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) **ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවලින් ලැබිය යුතු ශේෂ**

සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාරවලින් අය කර ගත යුතු මුදල් සහ හානිකරණය සඳහා ප්‍රතිපාදනය හා ඒ මත ලියාහරින ලද බොල් ණය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවලින් අය කර ගත යුතු මුදල් | 664,452,940 | 701,884,118 | 623,861,381 | 631,911,594 | 593,483,063 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 493,484,649 | 492,790,570 | 437,041,560 | 249,452,238 | 227,775,883 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය මුළු හිඟ මුදල්වල ප්‍රතිශතයක් ලෙස | 74 | 70 | 70 | 39 | 38 |
| වර්ෂය තුළ ලියා හරින ලද බොල් ණය | 13,483,407 | 5,517,032 | 73,113,266 | 8,306,417 | 9,279,955 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හානිකරණය සඳහා ප්‍රතිපාදන 2009 වර්ෂයේ දී සියයට 38 සිට 2013 වර්ෂයේ දී සියයට 74 දක්වා පසුගිය වර්ෂ 05 තුළ සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර ඒ අනුව එම ලැබිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ඉතා දුර්වල මට්ටමක වූ බව දක්නට ලැබුණි.

(ii) හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.493,484,649 න්, රු.486,153,378 ක් එනම් සියයට 99 ක් පමණ වූ හානිකරණ ප්‍රතිපාදනය 2013 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද හා වසා දමන ලද ව්‍යාපෘති සඳහා ලැබිය යුතු ශේෂ මත සියයට 100 ක් නියෝජනය විය.

(iii) වාර්ෂික ගාස්තු හානිකරණය සඳහා රු.201,012,748 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර මෙය 2013 දෙසැම්බර් 31 දිනට මුළු වාර්ෂික ගාස්තුවලින් සියයට 86 ක් හෝ රු.233,160,357 ක ප්‍රතිපාදනයක් කර තිබුණි

(ආ) වෙනත් ණයගැතියන්

-----------------------

දිර්ඝ කාලයක් අය නොකර පැවතුණු වෙනත් ණයගැතියන් සහ ශේෂ පත්‍ර දිනයට ඒ මත හානිකරණය සඳහා ප්‍රතිපාදනය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ තුන සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වෙනත් ණයගැතියන් | 131,274,290 | 66,891,763 | 61,204,152 | 103,810,214 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 120,257,749 | 61,204,152 | 7,688,630 | 48,234,339 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය වෙනත් මුළු ණයගැතියන්ගේ ප්‍රතිශතයක් ලෙස | 91.6 | 91.5 | 12 | 46 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂයෙන් වෙනත් ණයගැතියන් මත හානිකරණය සියයට 91.6 කින් නියෝජනය වූ බැවින් එම ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග දුර්වල මට්ටමක පැවති බව දැක්වේ.

(ii) වතුපිටිවල නිවාස ඒකක වෙන්දෙසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවති අතර එම සමාගම හා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(iii) වෙනත් ණය ගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් වංචාව හා රු.2,090 ක තොග ඌනතාවය වර්ෂ 10 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුනි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුළු මුදලින් සියයට 98 ක් එනම් රු. 128,982,001 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු ශේෂවලින් නියෝජනය විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පුනරුත්ථාපන හා දමිළ කටයුතු අමාත්‍යාංශය, ව්‍යාපාර සංවර්ධන කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ ව්‍යාපාර සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වැනි එවකට තිබූ අමාත්‍යාංශවලින් ලැබිය යුතු රු. 5,257,979 ක මුදලක් වෙනත් ණයගැතියන් තුළ ඇතුළත්ව තිබුණි.

- රජයේ ආයතන තුනකින් ලැබිය යුතු ලෙස රු.16,070,868 ක මුදලක් දක්වා තිබුණද, එම ආයතනවලින් ලැබුණු සනාථ කිරීම් අනුව නිරවුල් කළ යුතු කිසිදු හිඟ ශේෂයක් නොවීය.

- ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෙවිය යුතු ශේෂ හා අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය | මූල්‍ය ප්‍රකාශන අනුව **2013** දෙසැම්බර් **31** දිනට ශේෂය | | වෙනස |
|---|---|---|---|
| | ආයෝජන මණ්ඩලය | අදාළ ආයතනය | |
| | රු: | රු: | රු: |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) | 52,412,573 | 50,000,000 | 2,412,573 |
| ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 55,115,000 | නැත | 55,115,000 |

- සමහර රජයේ ආයතනවලින් ලැබිය යුතු හිඟ ශේෂ අයකරගනු වෙනුවට ගිණුම්වල බොල් හා අඩමාන ණය සඳහා සියයට 100 ක ප්‍රතිපාදනයක් කර තිබුණි. රජයේ ආයතනවලින් ලැබිය යුතු රු. 128,982,001 ක් වූ මුළු හිඟ ශේෂයෙන් රු. 118,114,460 ක් එනම් සියයට 91.57 ක් සඳහා හානිකරණ ප්‍රතිපාදනය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විවිධ ණය හිමි ශේෂය යටතේ ඇතුළත් කර තිබූ සමාලෝචිත වර්ෂය සඳහා විවිධ ආදායම් ලෙස රු. 5,931,949 ක මුදලක් හඳුනාගෙන තිබූ අතර සනාථ කිරීම්, ප්‍රභව ලියකියවිලි හා උපලේඛන ආදී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 2.2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත සහ 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීජ්/6 දරන ආජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ සේවකයන්ගෙන් අයකර ගැනීම වෙනුවට 1997 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා එකතුව රු. 161,120,804 ක්වූ උපයන විට ගෙවීම් බදු ආයෝජන මණ්ඩල අරමුදල්වලින් ගෙවා තිබුණි. |
| (ආ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව මාසික ප්‍රවාහන දීමනා ලබාගන්නා ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් මාසිකව රු.15,000 ක රියදුරු දීමනාද ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. 12,302,871 ක්වූ මුදලක් ඉහත දීමනා සඳහා ආයෝජන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2007 ජනවාරි 02 දිනැති අංක ඩීඑම්එස්/ඒ2/බීඕඅයි දරන කළමනාකරණ සේවා ලිපිය | (i) ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් වෘත්තීය දීමනා හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා දීමනා (මසකට අවමය රු. 5000) අදාළ අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පහත පරිදි ලබාගෙන තිබුණි. |

| වැටුප් වර්ගය | ප්‍රතිශතය |
|---|---|
| ජේ එම් වර්ගය | 10 |
| එම් එම් වර්ගය | 15 |
| එච් එම් වර්ගය | 20 |

සමලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය විසින් ගෙවන ලද එම දීමනාවල එකතුව රු. 2,392,917 ක් විය.

(ii) ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පැමිණීමේ දිරි දීමනා මෙන්ම භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කර ගැනීමේ දීමනාද ලබාගෙන තිබුණි. මෙහිදී පහත සඳහන් ගෙවීම් සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකර තිබුණි.

- පැමිණීමේ දිරි දීමනා රු.125,845,273
- නිවාඩු මුදල් කර ගැනීමේ දීමනා රු. 59,098,318

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.290,920,997 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.239,124,766 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.51,796,232 ක එනම් සියයට 22 ක වැඩිවීමක් දැක්වුණි. කුලී ආදායම, ජලය සැපයීමෙන් ආදායම හා බලපත්‍ර ගාස්තු ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය විසින් රු.228,429,052 ක මෙහෙයුම් ලාභයක් උපයාගෙන තිබූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.137,599,489 ක් වූ හෙයින් රු.90,829,563 කින් එනම් සියයට 66 කින් මෙහෙයුම් ලාභයේ වැඩිවීමක් දැක්වුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ආයෝජන මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ඉකුත් වර්ෂ 2 සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

| (i) <u>ලාභදායිත්ව අනුපාතය</u> | **2013** | **2012** | **2011** |
|---|---|---|---|
| | % | % | % |
| ශුද්ධ ලාභ අනුපාතය | 10.45 | 10.29 | 3.89 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය | 1.15 | 0.95 | 0.33 |


| (ii) | **මෙහෙයුම් අනුපාතය** | **2013** | **2012** | **2011** |
| --- | --- | --- | --- | --- |
| | ණය ගැති : පිරිවැටුම් අනුපාතය - වාර ගණන | 6.22 | 3.89 | 4.27 |
| | ණය ගැති : එකතු කිරීමේ කාලය - දින | 58 | 115 | 105 |

### 3.2.2 වියදම් විශ්ලේෂණය

-----------------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු වියදම්වලින් රු.1,983,947,246 ක් හෙවත් සියයට 79.6 කින් පරිපාලන වියදම්වලින් නියෝජනය වූ අතර එයින් සියයට 60 ක් කාර්යය මණ්ඩල වියදම්වලට අදාළ විය. මණ්ඩලයේ මුළු වියදම පිළිබඳ වර්ගීකරණයක් පහත සඳහන් වගුවෙන් හා රූපයෙන් දැක්වේ.

| **වියදම් වර්ගය** | **මුදල** රු | **ප්‍රතිශතය** |
| --- | --- | --- |
| මෙහෙයුම් වියදම් | 337,247,895 | 13.5 |
| පරිපාලන වියදම් | 1,984,841,156 | 79.6 |
| රජයේ බදු | 148,175,366 | 5.9 |
| වෙනත් වියදම් | 24,300,318 | 1 |
| එකතුව | 2,494,564,735 | |




### 3.2.3 අංශවල මෙහෙයුම් හා ලාභදායිත්වය

-------------------------------------

මණ්ඩලය යටතේ අපනයන සැකසුම් කලාප 10 ක් , කාර්මික උද්‍යාන 2 ක් හා ප්‍රාදේශීය කාර්යාලයක් ක්‍රියාත්මක වන අතර එම කලාප හා උද්‍යාන කිහිපයක මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

(i) පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයේ බදුවලට පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6.4 කින් එනම් සියයට 34 කින් අඩු වී තිබුණි.

(ii) විශාල පරිපාලන පිරිවැය හේතුවෙන් අපනයන සැකසුම් කලාප දෙකක් හා අපනයන සැකසුම් උද්‍යානයක් 2008 වර්ෂයේ සිට අඛණ්ඩව පාඩු දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | වර්ෂය තුළ දරන ලද පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| අපනයන සැකසුම් කලාප | | | | | | |
| වතුපිටිවල | 2,969 | 7,766 | 15,743 | 13,703 | 12,787 | 11,872 |
| කොග්ගල | 14,050 | 11,775 | 26,980 | 17,503 | 23,149 | 23,412 |
| අපනයන සැකසුම් උද්‍යාන | | | | | | |
| මල්වත්ත | 2,748 | 5,531 | 3,226 | 3,458 | 3,639 | 2,576 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 2013 වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ 4 තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සහ ගිවිසුම්වලට එළඹී ව්‍යාපෘති සහ අවලංගු කරන ලද සහ වසා දමන ලද හා අත් හිටුවන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** |
|---|---|---|---|---|---|---|
| 2013 | 172 | 140 | 75 | 120 | 38 | 7 |
| 2012 | 238 | 163 | 98 | 79 | 26 | 9 |
| 2011 | 160 | 165 | 99 | 47 | 7 | 4 |
| 2010 | 364 | 270 | 144 | 124 | 28 | 10 |
| 2009 | 384 | 182 | 134 | 93 | 12 | 4 |
| එකතුව | 1,318 | 920 | 550 | 463 | 111 | 34 |

√* පවත්නා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම ඇතුළත්ව

√** ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය අනුව

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව හා ගිවිසුම්වලට එළඹි ව්‍යාපෘති සංඛ්‍යාව පිළිවෙලින් සියයට 28 කින් හා සියයට 14 කින් අඩුවී තිබුණි.

(ii) වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 2009 වර්ෂයේ 134 සිට 2013 වර්ෂයේ 75 දක්වා අඩුවී තිබුණි.

(iii) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා වසාදමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව පිළිවෙලින් සියයට 50 කින් හා සියයට 46 කින් අඩුවී තිබුණි.

**(ආ) විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම**

(i) 2009 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා ආයෝජන මණ්ඩලය විසින් ආකාර්ෂණය කර ගන්නා ලද විදේශීය සෘජු ආයෝජන (FDI) පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අංශය** | **සෘජු ආයෝජනවල වටිනාකම** | | | | |
|---|---|---|---|---|---|
| | **2013** | **2012** | **2011** | **2010** | **2009** |
| | **එජඩො මිලියන** | **එජඩො මිලියන** | **එජඩො මිලියන** | **එජඩො මිලියන** | **එජඩො මිලියන** |
| නිෂ්පාදන | 359.76 | 307.65 | 322.42 | 159.65 | 164.47 |
| කෘෂිකාර්මික | 8.47 | 7.17 | 17.97 | 6.45 | 3.69 |
| සේවා | 1,023.17 | 1,023.33 | 725.67 | 350.20 | 434.09 |
| එකතුව | 1,391.40 | 1,338.15 | 1,066.06 | 516.30 | 602.25 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- 2011 වර්ෂයට සාපේක්ෂව 2012 හා 2013 වර්ෂවලදී කෘෂිකාර්මික අංශය යටතේ ආකර්ෂණය කර ගන්නා ලද ආයෝජනයන් පිළිවෙලින් සියයට 60 කින් හා සියයට 53 කින් අඩු වී තිබුණි.
- ආකර්ෂණය කර ගන්නා ලද මුළු විදේශීය සෘජු ආයෝජනයන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3 කින් වැඩි වී තිබුණි.
- නිෂ්පාදන අංශයේ විදේශීය සෘජු ආයෝජනයන් 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 17 කින් වැඩි වී තිබුණි.

(iii) 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුළ ආයෝජන මණ්ඩලය මඟින් ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDIS) සහ දේශීය ආයෝජනයන් (LI) පහත දැක්වේ.

| **වර්ෂය** | **ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDI)** | **ඉටුකර ගත් දේශීය සෘජු ආයෝජන** |
|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** |
| 2013 | 958,958 | 553,063 |
| 2012 | 828,005 | 452,154 |
| 2011 | 655,513 | 368,587 |

| | | |
|---|---|---|
| 2010 | 536,140 | 331,849 |
| 2009 | 495,506 | 278,762 |

සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDI) සහ දේශීය ආයෝජන ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 16 කින් හා සියයට 22 කින් වැඩි වී තිබුණි.

**(ඇ) ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම්**

**-----------------------------------------------**

පසුගිය වර්ෂ 5 තුළ ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි මුළු ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම් පහත වගුවෙන් හා රූප සටහනින් දැක්වේ.

| වර්ෂය | අපනයන ඉපැයීම් | අපනයන පිරිවැය |
|---|---|---|
| --------- | ------------------- | ----------------- |
| | එජඩො මිලියන | එජඩො මිලියන |
| 2013 | 6,606 | 4,525 |
| 2012 | 6,042 | 4,345 |
| 2011 | 6,572 | 4,400 |
| 2010 | 5,171 | 3,360 |
| 2009 | 4,563 | 2,739 |




ආනයන පිරිවැය හා අපනයන ඉපැයීම් පිළිබඳ උපනතිය

2012 වර්ෂයෙදී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මඟින් අපනයන ඉපැයීම් සියයට 8 කින් අඩුවී තිබුණද, 2013 වර්ෂයෙදී එය සියයට 9 කින් වැඩි වී තිබුණි. තවද ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මඟින් දරන ලද ආනයන පිරිවැය 2012 වර්ෂයෙදී සියයට 1 කින් අඩුවී තිබුණ අතර එය 2013 වර්ෂයේදි සියයට 4 කින් වැඩි වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයෝජන මණ්ඩලයට කාර්යාල ඉඩ පහසුකම් ලබාගැනීම සඳහා 1996 නොවැම්බර් මාසයේදී පුද්ගලික සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණු අතර ආරම්භක තැන්පතුවක් වශයෙන් රු.2,637,240 ක මුදලක් එම සමාගමට ගෙවා තිබුණි. පසුව මෙම කාර්යාල ඉඩ පහසුකම එම සමාගමට 2010 ජුනි මාසයේදී ආපසු භාර දී තිබුණි. කෙසේවුවද තැන්පතු මුදල ආපසු අයකර ගැනීමට 2014 දෙසැම්බර් 31 දක්වා ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ආ) 2013 වර්ෂය අවසානයට රු.2,025,485 ක් වූ මුළු ටෙන්ඩර් තැන්පතු ශේෂයෙන් රු.940,335 ක් හෙවත් සියයට 46 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් පැවති තැන්පතුවලින් නියෝජනය විය. කෙසේවුවද මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා 2013 වර්ෂය අවසානය දක්වාත් ආයෝජන මණ්ඩලය විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) මුළු රඳවා ගැනීම් රු.33,018,480 කින් රු.13,790,054 ක් හෙවත් සියයට 43 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවති මුදලක් නියෝජනය විය.

(ඈ) 2000 දෙසැම්බර් 29 දිනට පවතින විදුලි ගාස්තු රේටය වාර්ෂිකව සියයට 6.9 කට වඩා වැඩිවුවහොත් එකී විදුලිගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීමට පෙර අදාළ රාජ්‍ය ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබා ගෙන නොතිබුණි.

(ii) 2002 ජුනි සිට 2007 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ විදුලි ගාස්තු රේටය වැඩිවීම සම්බන්ධයෙන් රු. 356,793,568 ක මුදලක් සහ ජාත්‍යාන්තර වාණිජ මණ්ඩලයේ (ICC) ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය මඟින් දෙන ලද අවසාන තීරණය ප්‍රකාරව හානිය සඳහා ගෙවීම ප්‍රමාද වීම මත පොලිය හා සමාගම විසින් දරන ලද බේරුම්කරණ පිරිවැය සම්බන්ධයෙන් රු.388,161,877 ක මුදලක්ද සමාගම විසින් ඉල්ලා තිබුණි. ඉහළ වාණිජ අධිකරණයේදී, ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් ලබා දී තිබූ තීන්දුවට එරෙහිව ආයෝජන මණ්ඩලය විසින් අභියාචනයක් කර තිබුණි. පසුව ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් තීන්දුවක් ලබා දී තිබුණි. ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් ලබාදී තිබූ තීන්දුවට එරෙහිව සමාගම විසින් අභියාචනයක් කර තිබුණි. මෙම නඩු දෙකම නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබේ.

(iii) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීමට පෙර පරිභෝජනය සඳහා මෙම ප්‍රදේශයේ රබර් දැව ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අදාළ රජයේ ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබා ගෙන නොතිබුණි.

(iv) අධිකරණ නඩු පවතින බැවින් මෙම සමාගමෙන් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු බිම් කුලිය, ජල බිල්පත් හා බංගලා කුලිය ආදිය අයකර ගැනිමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඉ) ආයෝජන මණ්ඩලය විසින් පර්ත් වතුයාය මිලදී ගෙන තිබුණු අතර වතුයායෙන් කොටසක් වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රීලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (SLSPC) භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SLSPC) අදාළ මූල්‍ය ප්‍රකාශන 2006 වර්ෂයේ සිට ආයෝජන මණ්ඩලය වෙත ලැබී නොතිබුණි.

(ii) 2005 වර්ෂය තුළදී ප්‍රේෂණය කරන ලද රු.මිලියන 10 ක මුදල හැරුණු විට, එකඟ වූ පරිදි සංස්ථාව විසින් එහි ලාභය ක්‍රමවත්ව ආයෝජන මණ්ඩලයට ප්‍රේෂණය කර නොතිබුණි. 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතුයායට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේවුවද ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල 2013 දෙසැම්බර් 31 දක්වාත් හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(iii) පර්ත් වතුයායේ කරුණු සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව, කළමණාකරණ ගාස්තු සියයට 15 කින් වැඩි කිරීම, පර්ත් වතුයාය විසින් ආදායම ඒක පාර්ශවිකව උපයෝජනය කිරීම, පර්ත් වතුයායෙන් උපයා ගන්නා ලද රු.මිලියන 20 ක් වූ ආදායම කොන්ත්‍රාත්කරුගේ නමින් ආයෝජනය කිරීම,

රු.මිලියන 12.42 ක් වූ මෝටර් වාහන හා බංගලා කුලි අවිධිමත්ව ජංගම ගිණුම් මාර්ගයෙන් කොන්ත්‍රාත්කරුට මාරු කර ගැනීම වැනි කරුණු තවමත් විසඳා ගත යුතුව ඇත.

**4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------------

2003 ජනවාරි 08 දින රු.97,937,000 ක පිරිවැයකට මිලදී ගන්නා ලද මලිදූව කන්ද වතුයාය නම් වූ අක්කර 122 රූඩ් 01 පර්චස් 27.4 ක ඉඩම 2014 මැයි අවසානය දක්වා කිසිදු කාර්යයකට උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

**4.4 වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබාදී තිබු සම්පත්**

-----------------------------------------------

මණ්ඩලය විසින් රජයේ වෙනත් ආයතන සඳහා සමහර වත්කම් අවිධිමත්ව මුදාහැර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජී/පී1/40 දරන ලිපියේ විධිවිධානවලට සහ 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව 2009 වර්ෂය තුළදී මෝටර් වාහන දෙකක් එවකට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. මෙම මෝටර් වාහනවල අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා ආයෝජන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.2,751,809 ක මුදලක් වැය කර තිබුණි. අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු මුදල අයකර ගෙන හෝ ආයෝජන මණ්ඩලයේ ගිණුම්වල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) එවකට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ මෝටර් වාහනයක් 2013 ජූලි මාසයේදී අනතුරකට භාජනය වී තිබූ අතර හානිය හේතුවෙන් ඇස්තමේන්තු ගත අළුත්වැඩියා පිරිවැය රු. 1,412,687 ක් විය. එය රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම මුදලින් රු.129,309 ක් ආයෝජන මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි. අදාළ නිලධාරීයාගෙන් හෝ එවකට රේඛීය අමාත්‍යාංශයෙන් පාඩුව අයකර ගැනීමට ආයෝජන මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) රථගාල් කිරීමේ පහසුකම භාවිතා කිරීම සඳහා එවකට රේඛීය අමාත්‍යාංශයට ආයෝජන මණ්ඩලය විසින් මෝටර් වාහන ගාල් කිරීමේ අවසරපත්‍ර 9 ක් ගාස්තු අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. තවද, 2007 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා වාහන ගාල් කිරීමේ පහසුකම ලබා දීම වෙනුවෙන් රු. 1,489,500 ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයට ගෙවා තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විධායක ශ්‍රේණියේ තනතුරු 96 කින් සමන්විතව (අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර ඇතුළත්ව) කාර්ය මණ්ඩලයේ විවිධ වර්ගයන්හි පුරප්පාඩු 149 ක් පැවති අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු විධිමත් පියවරක් ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව | |
| විධායක කාර්ය මණ්ඩලය | 589 | 489 | 04 | 493 | 96 |
| ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය | 378 | 336 | 13 | 349 | 29 |
| සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලය | 332 | 288 | 20 | 308 | 24 |
| එකතුව | 1299 | 1113 | 37 | 1150 | 149 |

(ආ) ආයෝජන මණ්ඩලය විසින් පුද්ගලික ආයතනයකින් සේවකයන් 18 දෙනෙකු බාහිරව බඳවා ගෙන තිබුණි. ඉන් සේවකයන් 14 දෙනෙකු 2010 වර්ෂයට පෙර බාහිරව ලබාගන්නා ලදී.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්තිවලට පටහැනිව, සේවකයන් 9 දෙනෙකු ආයෝජන මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා වේතන ලෙස රු. 6,390,185 ක මුදලක් දරා තිබුණි.

## 4.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහජන විරෝධතා, දුර්වල කාර්ය සාධනය හා කළමනාකරණ තීරණ ආදීය හේතුවෙන් කෙටි කාල පරිච්ඡේදයක් ඇතුළතදී ඉදිකිරීම් වැඩ තුනක් නවතා දැමීම මගින් ආයෝජන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.20,292,250 ක පාඩුවක් දරා තිබුණි.

(ආ) කටුනායක අපනයන සැලසුම් කලාපයේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරයක් විසින් පෙර භාවිතා කරන ලද ධාරණ අගය රු. 95,822,000 ක් වූ ආයෝජන මණ්ඩලයට අයත්ව තිබූ ඉඩමක්, 2013 වර්ෂයේදී අවසන් කර සම්පූර්ණ කිරීමේ පදනම මත රු. 225,000,000 කට රාජ්‍ය සමාගමකට භාරදී තිබුණි. ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද මෙම ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු.135,000,000 ක් විය. මෙම ගනුදෙනුවේදී ආයෝජන මණ්ඩලයට රු. 39,178,000 ක ලාභයක් උපයා ගැනීමට හැකිව තිබුණද, ආයෝජන මණ්ඩලය හා පෙර පදිංචිකරු අතර එළඹ තිබූ ප්‍රධාන ගිවිසුමේ විධිවිධානයන්හි ප්‍රතිඵලයක් ලෙස එය ලාභයක් ලෙස හඳුනා ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයට සිදුවී තිබූ පාඩුව රු.77,016,960 ක් විය.

## 4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2009/2010 වර්ෂය තුළදී පුත්තලම, සෙල්ලකන්දහි ආයෝජන ප්‍රවර්ධන කලාපයක් ස්ථාපිත කිරීමට ආයෝජන මණ්ඩය විසින් සැලසුම් කර තිබුණු අතර මූලික වියදම් ලෙස රු. 11,270,120 ක මුදලක් දරා තිබුණි. පසුව එය අත්හිටුවා තිබූ අතර 2012 වර්ෂයේදී ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය ලියා හැර තිබුණි. කෙසේවුවද, ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2013 වර්ෂයේදී සංවර්ධන කාර්යයන් ආයෝජන මණ්ඩලය විසින් නැවත ආරම්භ කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 සංයුක්ත සැලැස්ම

---

2009 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඉලක්කයන්ගෙන් පහත දැක්වෙන ඉලක්කයන් ඉටුකර ගැනීමට 2013 වර්ෂය අවසානය වන විටත් ආයෝජන මණ්ඩලයට නොහැකිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) 2009/2010 වර්ෂයේදී මඩකලපුව හා අම්පාරහි නව ආයෝජන ප්‍රවර්ධන කලාප හඳුනා ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණද , 2013 දෙසැම්බර් 31 වන විටත් එම ආයෝජන ප්‍රවර්ධන කලාප ස්ථාපිත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2009/ 2010 වන විට කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැරව ස්ථාපිත කිරීමට ඉලක්ක කර තිබුණු නව ව්‍යාවසායන් 300 න් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 89 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තියට අනුව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටුව ක්‍රමානුකූලව රැස්විය යුතු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් සහිතව එහි නිරීක්ෂණයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. 2013 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 4 ක් ආයෝජන මණ්ඩලය විසින් පවත්වා තිබුණද, සියළුම රැස්වීම් වර්ෂයේ අවසාන මාස 6 තුළ පවත්වා තිබුණු බැවින් නිරීක්ෂණයන් අඛණ්ඩව සමාලෝචනය කිරීමට මෙය ඵලදායී ක්‍රමයක් ලෙස භාවිතා කර නොතිබුණි.

### 5.4 අයවැය පාලනය

---

අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඇ) ඉදිකිරීම්
(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) ආදායම එකතු කිරීම